බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**External Degrees and Extension Courses Unit**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**University of Sri Jayewardenepura**


| | | | |
|---|---|---|---|
| මගේඅංකය My Number | USJP/EEX13 /2024 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10,Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka, |
| ඔබේඅංකය Your Number | | | |
| දුරකථනය Telephone | 011-2801481,011-3132496 | වෙබ්අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | | විද්‍යුත් තැපැල E-mail | info.ext@sjp.ac.lk |


2024-07-16

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

**2021 විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි තෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම - 2024**

01. ඉහත පරීක්ෂණයට අයදුම් කිරීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

| | |
|---|---|
| **පරීක්ෂණ අයදුම්පත ලබා ගැනීම** | www.external.sjp.ac.lk/ B.Sc. Business Studies (General) External Degree/ Exam Applications වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය "V" අකුර රහිතව යෙදීමෙන් (Download) කර ගත හැක. |
| **අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** |
| **අයදුම්පත් භාරගන්නා අවසාන දිනය** | **2024 අගෝස්තු 09** |

02. සැලකිය යුතුයි

I. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ප්‍රථම, ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ පරීක්ෂණයේ නම සඳහන් කළ යුතු වේ.

II. **මෙම පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරික ගෙවා සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති අයදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් නොකෙරේ.**

III. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2024 අගෝස්තු 09** වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

IV. විදෙස්ගත සිසුන් සඳහා විභාග අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පරීක්ෂණ (EDECU Online Distance Supervision Examinations) සඳහා පෙනී සිටිය හැකි වේ. ඒ සම්බන්ධයෙන් විස්තර http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/ වෙත පිවිසීමෙන් ලබාගත හැකි වේ.

V. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියලු දැනුවත් කිරීම් වෙබ් අඩවිය හරහා පමණක් සිදු කරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරීම අත්‍යවශ්‍යය වේ.

VI. නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශ පත්‍ර **www.external.sjp.ac.lk/ B.Sc. Business Studies (General) External Degree/ Exam Admissions** වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය **V** අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබා ගත හැකි අතර විභාග ප්‍රවේශ පත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.

VII. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 09/2021 අනුව ඔබට අදාල උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය නිකුත් කරනුයේ ඔබ විසින් බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී ඉදිරිපත් කරන ලද උප්පැන්න සහතිකයේ සඳහන් නමට පමණි. ඒ අනුව විභාග අයදුම්පත සමඟ ඇති අයදුම් පත්‍ර අංක 01 නිවැරදිව සම්පූර්ණ කර උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් සමඟ එවිය යුතුවේ.

**<u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ</u>**

**<u>292 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු</u>**

**බාහිර අපේක්ෂකයන් සඳහා**

7.4 අසනීප නිසා මුළු විභාගයටම හෝ විභාගයේ කොටසකට පෙනී නොසිටි/ නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාග ආරම්භ වීමට ප්‍රථම හෝ විභාග පැවැත්වෙන කාල සීමාව තුළ හෝ රජයේ ආරෝග්‍ය ශාලාවකින් වෛද්‍ය සහතිකයක් නියෝජ්‍ය ලේඛකාධිකාරී හෝ සහකාර ලේඛකාධිකාරී/ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය.

7.5 නොවැලැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් අදාල විභාගය හෝ විභාගයේ කෙටස පැවැත්වීමට නියමිත දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික පිළිගනු නොලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2024-07-16